**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

## අදියර III විභාගය - ජනවාරි 2022

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

---

**මූල්‍ය පාලනයන් සහ විගණන ප්‍රශ්න පත්‍රය අනිවාර්ය ප්‍රශ්න 9 කින් සමන්විත විය. ප්‍රශ්න පත්‍රය කොටස් 3 ක් තිබුණි. එකකට ලකුණු 5 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න 4ක් A කොටසේ අඩංගු විය. එකකට ලකුණු 10 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න 3ක් B කොටසට අඩංගු විය. C කොටසට එකකට ලකුණු 25 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න 2 ක් අඩංගු විය.**

**අයදුම්කරුවන්ගෙන් බහුතරය සියලුම ප්‍රශ්නවලට උත්තර ලියා තිබුණි. කෙසේවෙතත් ප්‍රශ්නවල සමහර කොටස් සඳහා උත්තර ලියා නොතිබුණි. මෙය සිදුවී ඇත්තේ ප්‍රධාන වශයෙන් දුර්වල කාල කළමනාකරණය, දැනුම නොමැති වීම සහ ප්‍රශ්නයෙන් අවශ්‍ය කර තිබූ දේ අවබෝධ කර නොගෙන තිබීම නිසාය.**

**සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක තිබුණේය.**

## A කොටස

### ප්‍රශ්න අංක 01

හොඳ සංයුක්ත පාලන පද්ධතියක් අනුගමනය කිරීම මඟින් සමාගමකට ලබා ගත හැකි වාසි 3 ක් හඳුනා දැක්වීම **(a) කොටසින්** අවශ්‍ය කර තිබූ අතර, සංවිධානමය ව්‍යුහය හැරුණු විට සංවිධානයක පාලන ආකෘතිමය රාමුවේ පවතින වෙනත් සංරචක කොටස් දෙකක් සඳහන් කිරීම **(b) කොටසින්** අවශ්‍ය කර තිබුණි. ප්‍රශ්නයේ කොටස් දෙකම සෘජු ඒවා වූ අතර කෙලින්ම උත්තර ලිවිය හැකි ඒවා විය. කෙසේ වෙතත් කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය. සංයුක්ත පාලනය ගැන පැහැදිලි අවබෝධයක් තිබූ අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේය. සංයුක්ත පාලනය ගැන සාමාන්‍ය අවබෝධයක් නොමැති වීම නිසා **(a) කොටස** සඳහා සමහර අයදුම්කරුවන් ඉතාමත් ස්වල්ප ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි.

**(b) කොටස** සඳහා සමහර අයදුම්කරුවන් සංවිධාන ව්‍යුහය නැවත ලියා තිබූ අතර කිසිඳු ලකුණක් උපයාගෙන නොතිබූ අතර මෙයින් පෙනී ගියේ නිසි අවධානයෙන් අයදුම්කරුවන් ප්‍රශ්නය කියවා නොතිබූ බවය.

**(b) කොටස** සඳහා අයදුම්කරුවන් ලියා තිබූ අදාල නොවන උත්තර සමහරක් පහත දක්වා ඇත:

- මූල්‍ය ව්‍යුහය
- මානව සම්පත් කළමනාකරණය
- විනිවිද භාවය
- අභ්‍යන්තර පාලනය

සතුටුදායක අන්දමට ලකුණු ලබා ගැනීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ:

(1) සංවිධානයේ සංයුක්ත පාලනයේ සංරචකයන්

(2) සංයුක්ත පාලනයේ මූලධර්ම සහ තිබීමේ වාසි

(3) අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ විගණන කමිටුවේ කාර්යයන්

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්ය සාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 02

සංවිධානයක් විසින් මුහුණදෙනු ලබන අභ්‍යන්තර අවදානම් 2 ක් එකිනෙක සඳහා උදාහරණයක් සමග පැහැදිලි කිරීම ප්‍රශ්නයෙන් අවශ්‍ය කර තිබේ.

ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක තිබුණේය.
අයදුම්කරුවන් බොහොමයක් සංවිධානයක් මුහුණ දෙන අභ්‍යන්තර අවධානම් හඳුනාගෙන පැහැදිලි කර තිබුණේ වී නමුත් සමහර අයදුම්කරුවන්ට එකිනෙක සඳහා උදාහරණයක් බැගින් සඳහන් කිරීමට නොහැකි විය.
පහත සඳහන් ක්ෂේත්‍ර ගැන ඔවුනගේ දැනුම වැඩි දියුණු කර ගන්නා ලෙස උපදෙස් දෙනු ලැබේ.

- සංවිධානයේ බාහිර හා අභ්‍යන්තර අවදානම්
- අවදානම් කළමනාකරණ රාමුව
- අවදානම් තුනී කිරීම සඳහා භාවිතා කරන ශිල්පීය ක්‍රම
- තොරතුරු තාක්ෂණය යොදාගෙන අවදානම් හඳුනාගැනීම, වාර්තාකරණය සහ කළමනාකරණය
- අවදානම් කළමනාකරණ රාමුව භාවිත කිරීමේ අවදානම් සහ අවස්ථා

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 03

සහතිකවීමේ කාර්යභාරයක මූලිකාංග දී තිබෙන සිදුවීම් පෙළ හා සම්බන්ධ කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය කර තිබේ.

අයදුම්කරුවන් සැලකිය යුතු ගණනකට සහතිකවීමේ කාර්යභාරයේ මූලිකාංග සඳහන් කිරීමේ හැකියාව තිබුණත් දී තිබූ සිදුවීම් පෙලට සම්බන්ධ කිරීම කළ නොහැකි වී ඇත.

මෙයින් පෙනී යන්නේ සහතිකවීමේ කාර්යභාරයන් සහ එහි මූලිකාංග පිළිබඳ අයදුම්කරුවන්ගේ අවබෝධය අවම මට්ටමක පවතින බවය.

අයදුම්කරුවන් විසින් සිදුකර තිබූ ඇතැම් වැරදි පහත පරිදි වේ:

- **සීමාසහිත SJ (පුද්ගලික) සමාගම** අපේක්ෂිත පරිශීලක ලෙස සඳහන් කිරීම.
- සහනදායී ණය විෂය කරුණු ලෙස හඳුනා දැක්වීම.
- විගණන වාර්තාව සාක්ෂි ලෙස හඳුනා ගැනීම.

පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ ඔවුන්ගේ දැනුම වර්ධනය කරගන්නා ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ:

- සහතිකවීමේ කාර්යභාරයක් යනු කුමක්ද?
- සහතිකවීමේ කාර්යභාරයක අරමුණ.
- සහතිකවීමේ කාර්යභාරයක මූලිකාංග.
- සහතිකවීමේ කාර්යභාරයක් පිළිගෙන කළමනාකරණය කිරීමේදී පිළිපැදිය යුතු අවස්ථා හා ප්‍රධාන පැතිකඩ.
- අදාල වෙනත් සේවා.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමට වඩා පහළ විය.**

## ප්‍රශ්න අංක 04

මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සඳහා අවශ්‍ය කරන විගණන ගුණත්ව අවශ්‍යතා පරීක්ෂා කිරීම මත මෙම ප්‍රශ්නය පදනම් වී ඇත.

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** විගණන ආයතනයේ සේවයේ යොදවා ඇති පුද්ගලයන්ගේ හැකියා වර්ධනය කිරීමේ ක්‍රම දෙකක් හඳුනා දැක්වීම අවශ්‍ය කරන ලදී. මෙය ලකුණු උපයා ගැනීමට පහසු ප්‍රශ්නයක් වුවද, කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි. මෙහිදී අයදුම්කරුවන් හට ප්‍රශ්නයෙන් අවශ්‍ය කර තිබූ දෙය වටහා ගැනීමට නොහැකි වී තිබුණි. අයදුම්කරුවන් විසින් සපයා තිබූ අදාල නොවන උත්තර සමහරක් මෙසේය:

- නිවසේ සිට වැඩ කිරීමේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.
- කාර්යසාධන ඇගයීම.
- ගුණත්ව පාලන අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම ආදිය.

ප්‍රශ්නයේ **(b) කොටසින්** විගණන ආයතනයක් විසින් ස්ථාපිත කොට පවත්වා ගෙන යා යුතු තත්ව පාලන පද්ධතියක මූලිකාංග 3 ක් සඳහන් කිරීම අවශ්‍ය කර තිබුණේය. ඒ සඳහා කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණේය.

අසාර්ථක වූ අයදුම්කරුවෝ තත්ව පාලන පද්ධතියකට අදාල ප්‍රතිපත්ති., ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි සඳහන් කර තිබුණේය.

උදා - අධීක්ෂණය

සමාලෝචනය

ස්වාධීනත්වය

රහස්‍යභාවය

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

## B කොටස

### ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය අවදානම් තක්සේරු කිරීමේ විගණන පටිපාටි මත පදනම් වී ඇත. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයට උත්තර ලියා තිබූ නමුත් කාර්යසාධනය සතුටුදායක මට්ටමක තිබුණේ නැත. ප්‍රශ්නය හරි හැටි තේරුම් නොගැනීම මෙයට හේතු වී තිබේ.

ඒ නිසා, පහත දැක්වෙන ක්ෂත්‍ර කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කරන ලෙස අයම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ:

- අස්තිත්වය සහ පරිසරය පිළිබඳ අවබෝධ කර ගැනීම
- විගණන ප්‍රමාණාත්මක භාවය
- විගණන ලිඛිතතකරණය
- වංචාවන්ට අදාලව විගණක ගේ වගකීම.

**(a) කොටස** සඳහා අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු පමණක් "අවදානම් තක්සෙරු කිරීමේ ක්‍රියා පටිපාටිය" යන පදය නිවැරදි ලෙස පැහැදිලි කොට ලකුණු උපයාගෙන තිබණේය.

**(b) කොටසින්**, අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි 3 ක් සඳහන් කිරීම අවශ්‍ය විය. කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක තිබූ අතර අයදුම්කරුවන් විසින් සපයා තිබූ අදාල නොවන උත්තර කිහිපයක් පහත දක්වා ඇත:

- අවදානම අඩු කිරීම
- අවදානම මාරු කිරීම
- අවදානවම වැළැක්වීම
- අවදානම පිළිගැනීම

**(c) (i) කොටසින් HPL සමාගමට** අදාලව සලකා බැලිය යුතු වංචා අවදානම් සාධක දෙකක් සඳහන් කිරීම අවශ්‍ය කර තිබුණි. අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක විය.

**(c) (ii) කොටසින් HPL සමාගමෙන්** වංචා වැලක්වීම සහ අනාවරණය කිරීම සම්බන්ධයෙන් විගණක ගේ වගකීම පැහැදිලි කිරීම අවශ්‍ය විය. අයදුම්කරුවන්ගේ කාර්යසාධනය ඉතාමත් දුර්වල විය.

වංචා හා / හෝ දෝෂ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණීය සහතික වීමක් විගණක විසින් ලබා ගත යුතු බව සඳහන් කර තිබුණේ අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු පමණි. තවද, විගණනයක ආවේණික සීමාකරණ හේතු කොටගෙන පැන නගින නොවැලැක්විය හැකි අවදානම් ගැන ඔවුන් සඳහන් කර තිබුණේ නැත.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** වෘත්තීය සංශයාදෘෂ්ඨිය සහ වෘත්තීය විනිශ්චය අතර ඇති වෙනස සඳහන් කිරීම අවශ්‍ය විය. අයදුම්කරුවන් සියළු දෙනාම වාගේ මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර විස්තරාත්මක පැහැදිලි කිරීම් සපයා තිබුණේය. කෙසේ වෙතත් අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු පමණක් ඒවා අතර වෙනස නිවැරදිව සඳහන් කර තිබුණේය

එහෙයින්, ආචාරධර්මයානුකූල අවශ්‍යතා වෘත්තීය සංදෘශ්ඨිය, වෘත්තීය විනිශ්චය ආදිය වැනි විගණනය කෙරෙහි බලපාන පොදු මූලධර්ම පිළිබඳ හොද අවබෝධයක් ලබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

ප්‍රශ්නයේ **(b) කොටසින්** දේපළ පිරියත හා උපකරණවලට අදාල මූල්‍ය ප්‍රකාශන සැසඳුම් දෙකක් පැහැදිලි කිරීම අවශ්‍ය විය. මෙය සෘජු ප්‍රශ්නයක් වූ අතර කෙලින්ම උත්තර ලිවිය හැකි එකක් ය. කෙසේවෙතත්, කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.

බොහෝ අයදුම්කරුවෝ පහත සඳහන් අදාල නොවන උත්තර ලියා කිසිදු ලකුණක් නොලැබුහ:

- වත්කම් බැහැර කිරීම.
- ක්ෂය කිරීම්.
- ප්‍රත්‍යාගණනය.

ප්‍රශ්නයේ **(c) කොටසින්** විගණකගේ සමස්ත අරමුණ පැහැදිලි කිරීම අවශ්‍ය විය. අයදුම්කරුවන් බොහෝමයක් අරමුණු පැහැදිලි කිර තිබු නමුත් පහත දැක්වෙන වැදගත් කරුණු නොසලකා හැර තිබුණේය.

- සත්‍ය බවට සාධාරණ සහතිකයන් ලබා ගැනීම.
- මූල්‍ය ප්‍රකාශන සමස්ත වශයෙන් සලකා බැලීම.
- විගණකට මතයක් ප්‍රකාශ කිරීමේ හැකියාව ලබා දිම.
- අදාල වන්නා වූ මූල්‍ය වාර්තාකරණ රාමුව.
- ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලින් අවශ්‍ය කෙරෙන ආකාරයට මූල්‍ය ප්‍රකාශන මත වාර්තා කිරීම.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය..**

## ප්‍රශ්න අංක 07

ඒ ඒ ටී ශ්‍රී ලංකා සුදුසුකම් ලත් සාමාජිකයින් විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම මූලික මූලධර්ම මත මෙම ප්‍රශ්නය පදනම් වී තිබුණේය

ප්‍රශ්නයේ **(a) කොටසින්** ඒඒටී ශ්‍රී ලංකා ආයතනයේ සාමාජිකයන්ට අදාලවන වෘත්තීය ආචාරධර්මවල මූලික මූලධර්ම තුන(3) ක් පැහැදිලි කිරීමත් **(b) කොටසින්** ආචාරධර්ම වල මූලික මූලධර්මයන්ට අනුකූල වීමේදී පැන නැගිය හැකි තර්ජන දෙකක් (2) එකිනෙක සඳහා උදාහරණයක් සමඟ පැහැදිලි කිරීමට අවශ්‍ය විය.

වෘත්තිය ආචරධර්ම, මූලික මූලධර්ම පිළිබඳව තරමක දැනුමක් ඇති අයදුම්කරුවන් සතුටුදායක අයුරින් ලකුණු ලබාගෙන තිබුණි. සෙසු අයදුම්කරුවන් පහත දැක්වෙන පරිදි අදාල නොවන උත්තර ලියා තිබුණි.

**(a)** **කොටස** - නායකත්ව කුසලතා

- වයස් සීමාව
- වඩා ප්‍රබල ගිණුම්කටයුතුභාවය ආදිය

**(b)** **කොටස** - විවිධ අදහස් නිසා ඇතිවන ගැටුම්

- නීති රෙගුලාසි කඩ කිරීම,
- ප්‍රමාණාත්මක අවප්‍රකාශන සිදුකිරීම ආදිය

පහත ක්ෂත්‍රයන් පිළිබඳව සෑහෙන දැනුමක් ලබා ගන්නා ලෙස අයදුම්කරුවන් ට උපදෙස් දෙනු ලැබේ.

- වෘත්තීය ආචාරධර්ම වල මූලික මූලධර්ම
- නව සේවාදායකයෙකු භාරගැනීමේදී සලකා බැලිය යුතු කරුණු
- මූලික මුලධර්ම පිළිපැදීමේදි මතුවිය හැකි තර්ජන
- තර්ජන පිටු දැකීමේ පරික්‍ෂක විධිවිධාන
- විගණකගේ ස්වාධින සංකල්පය

**මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

## <u>C - කොටස</u>

## ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය විෂය අධ්‍යයන පාදක ප්‍රශ්නයක් වූ අතර, අභ්‍යන්තර පාලනයත්, ව්‍යාපාරික ක්‍රියාවලීන් සහ තොරතුරු තාක්‍ෂණ පාලනයන් පිළිබඳ දැනුම පරීක්‍ෂාවට ලක්කළ ප්‍රශ්නයක් විය. අයදුම්කරුවන් විසින් අභ්‍යන්තර පාලනය නිර්වචනය කිරීම, අභ්‍යන්තර පාලන දුර්වලතා හඳුනා ගැනීම සහ ප්‍රශ්නයේ දී තිබු සිදුවීම් පෙළෙහි දක්නා ලැබෙන දුර්වලතා පිටුදැකීමට නිර්දේශ දැක්වීමට අපේක්‍ෂා කර ඇත.

**(a) කොටස**

"අභ්‍යන්තර පාලනය" යන පදය නිර්වචනය කිරීම අවශ්‍ය කරන ලදී. අයදුම්කරුවන්ගෙන් අතලොස්සක්, නිවැරදිව, මෙම පදය නිර්වචනය කර තිබුණි. ස්ව-අධ්‍යයන පාඨමාලා ග්‍රන්ථයේ මෙම පදය පැහැදිලිව නිර්වචනය කර තිබේ. මෙයින් දැක්වෙන්නේ අයදුම්කරුවන් අදාල ස්ව-අධ්‍යයන පොත් කෙරෙහි නිසි අවධානයක් නොදක්වා ඇති බවයි.

අයදුම්කරුවන් විසින් සපයා තිබූ අදාල නොවන උත්තර සමහරක් මෙසේය:

- අභ්‍යන්තර පාලනය කළමනාකරණ ක්‍රියාවලියකි.
- මෘදුකාංග පද්ධති සංවර්ධනය සහ පවත්වා ගැනීම ආදිය.

අභ්‍යන්තර පාලනය නිර්වචනය කිරීමේදී අයදුම්කරුවන් විසින් පහත සඳහන් දෑ අවධාරණය කළ යුතුය.

(1) අභ්‍යන්තර පාලනය යනු, පාලනය කිරීමේ කාර්යභාරය පවරනු ලබා ඇත්තන් විසින් ක්‍රියාත්මක කර පවත්වා ගනු ලැබිය යුතු ක්‍රියාවලියකි.

(2) අභ්‍යන්තර පාලනයේ අරමුණු (මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයභාවය, මෙහෙයුම්වල සඵලතාව සහ කාර්යක්‍ෂමතා වල නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම).

**(b) සහ (c) කොටස්**

**සිමාසහිත AB පුද්ගලික සමාගමේ** අභ්‍යන්තර පාලන දුර්වලතා පහ (5) ක් හදුනා දැක්වීම **(b) කොටසින්** අවශ්‍යකර තිබූ අතර එම දුර්වලතා මැඩපැවැත්වීමට එකිනෙක සඳහා නිර්දේශය බැගින් සඳහන් කිරීම **(c) කොටසින්** අවශ්‍යකර තිබුණේය. කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.

සමහර අයදුම්කරුවන් අභ්‍යන්තර පාලන දුර්වලකම් හදුනා නොගෙන ප්‍රශ්නයේ දි තිබූ තොරතුරු නැවත ලියා තිබුණේය. මෙය අභ්‍යන්තර පාලනයන් පිළිබඳ දැනුම අවම මට්ටමක පැවති නිසා විය හැක.

නිර්දේශ දැක්වීමේදි බොහොමයක් අයදුම්කරුවන් පහත සඳහන් දෑ වැනි පොදු අභ්‍යන්තර පාලනයන් සඳහන් කර තිබුණේයඃ

- රාජකාරි වැඩ බෙදා වෙන්කිරීම
- බලය දීම සහ අනුමතකිරීම
- සංවිධානමය පාලනයන්, ගිණුම්කරන පාලනයන්, ආදිය

**(d) කොටස**

**සිමාසහිත AB පෞද්ගලික සමාගමේ** තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය තුළ සැලසුම්කර නොමැති තොරතුරු තාක්ෂණයේ පොදු පාලනයන් හතර (4) ක් එකිනෙකට උදාහරණයන් සමග පැහැදිලිකිරීම මෙම කොටසින් අවශ්‍යකර තිබුණි. මෙම ප්‍රශ්නයට උත්තර ලිවීම සඳහා අයදුම්කරුවන්ට පොදු තොරතුරු තාක්ෂණය පිළිබඳ සැහෙන දැනුමක් තිබිය යුතුය.

ප්‍රශ්නයේ දී තිබූ තොරතුරු වලට යොමු වී උදාහරණ ලේසියෙන් හඳුනාගත හැකිවූ බැවින් ප්‍රමාණවත් දැනුමක් තිබූ අයදුම්කරුවන් යෝග්‍ය ලෙස සැලසුම්කර නොමැති පාලනයන් හඳුනාදක්වා තිබුණි. කෙසේවුවත් කාර්යසාධනය තිබුණේ සාමාන්‍ය මට්ටමකය.

**(e) කොටස**

අභ්‍යන්තර පාලන පද්ධතිය තුල ඇතුළත් පාලන පරිසරයේ මූලිකාංග හතර (4) ක් සඳහන් කිරීම (e) කොටසින් අවශ්‍ය විය.

ස්ව-අධ්‍යයන පාඨමාලා ග්‍රන්ථයෙහි පාලන පරසරයේ මූලිකාංග හත (7) ක් පැහැදිලි ලෙස සඳහන්කර ඇත. කෙසේවුවත් කාර්යසාධනය ඉතාමත් දුර්වල විය. සමහර අයදුම්කරුවන් පහතින් දක්නට ඇති ඒවා වැනි අදාල නොවන උත්තර සපයා තිබුණේය.

- මෙහෙයුම් පාලන පද්ධතිය
- අනාවරණ (detective) පාලන පද්ධතිය
- උපදේශනය (Mentoring)
- පාලන විශ්ලේෂණය

**මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක තිබුණේය.**

## ප්‍රශ්න අංක 09

### (a) කොටස

**සීමාසහිත සෑම් සමාගමේ** විගනණය ඉටුකිරිමෙදි විශේෂ අවධානයක් ලබා දියයුතු ක්ෂේත්‍ර පහක් (5) ක් හඳුනාදැක්විම මෙම කොටසින් අවශ්‍ය විය.

ප්‍රශ්නයේ දී තිබූ තොරතුරුවල ක්ෂෙත්‍ර දහයකට වඩා තිබූ බැවින් කාර්යසාධනය සතුටුදායක මට්ටමක තිබුණේය.

අසාර්ථක වූ අයදුම්කරුවන් පහත දක්වා ඇති ඒවා වැනි අදාල නොවන උත්තර සපයා තිබුණේය:

- මූල්‍ය ක්ෂේත්‍රය
- මෙහෙයුම් ක්ෂේත්‍රය
- ප්‍රමාණාත්මක මට්ටම්

### (b) කොටස

විගණන ප්‍රමාණාත්මකභාවය නිර්ණය කිරීමේදී සලකා බැලියයුතු සධක හතරක් සඳහන් කිරිම අවශ්‍ය විය. මෙය න්‍යායයික ප්‍රශ්නයක් වූ අතර ප්‍රමාණාත්මකභාව පිළිබද තාක්ෂණික දැනුම පරික්ෂා කරන්නක් විය. කාර්යසාධනය ඉතාමත් දුර්වල විය. අයදුම්කරුවන්ගෙන් අතලොස්සක් පමණක් මෙම කොටසට ලකුණු ලබාගෙන තිබුණේය.

### (c) කොටස

**සීමාසහිත සෑම් සමාගමේ** මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරිමේදි අඛණ්ඩ පැවැත්ම උපකල්පනයේ අදාලත්වය විමසිම මෙම කොටසින් අවශ්‍ය විය. කාර්යසාධන මට්ටම සාමාන්‍ය මට්ටමට වඩා පහළින් තිබුණි. සමහර අයදුම්කරුවන් අඛණ්ඩ පැවැත්ම උපකල්පනය පොදුවේ සලකාබලා තිබුණා මිස **සීමාසහිත සෑම් සමාගමේ** අවිනිශ්චිතතා සැලකිල්ලට ගෙන තිබුණේ නැත. අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු අඛණ්ඩ පැවැත්ම සහිතව පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව තක්සේරු කිරිම කළමනාකරණයේ වගකිම බව සඳහන් කර තිබුණේය.

පහත දැක්වෙන ක්ෂේත්‍රයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ලබාගන්නා ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ:

- අඛණ්ඩ පැවැත්ම උපකල්පනය.
- අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සැක පහලකරන සිදුවිම්.
- අඛණ්ඩ පැවැත්ම සඳහා කළමනාකරණයේ වගකිම්.
- අඛණ්ඩ පැවැත්ම සමාලෝචන සඳහා විගණන ක්‍රියාපාටින්.
- විගණකගේ වාර්තා කිරීම්.

**(d) කොටස**

ප්‍රශ්නයේ දී ඇති කරුණු, විගණන මතය කෙරෙහි කරනු ලබන බලපෑම තක්සේරු කිරීම මෙම කොටසින් අවශ්‍යකර තිබේ.

**කාර්යසධනය සතුටුදායක මට්ටමක තිබුණේ නැත.**

සමහර අයදුම්කරුවන් අදාල බලපෑම ප්‍රමාණාත්මකව ඉදිරිපත් කර තිබූ නමුත් ප්‍රමාණාත්මක මට්ටමෙන් තක්සේරුකර තිබුණේ නැත. අයදුම්කරුවන්ගෙන් ස්වල්ප දෙනෙකු සඳහන් කරුණු වල සමස්ත බලපෑම ප්‍රමාණාත්මක බව සඳහන් කරමින් කළමනාකරණය ගැලපීම් කිරීමට එකඟ නොවන්නේනම් විගණක විසින් මතය විකරණය කළ යුතු බව සඳහන් කර තිබුණේය.

පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව ඔවුන්ගේ දැනම දියුණුකරගත යුතු ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

- අවප්‍රකාශනවල බලපෑම ප්‍රමාණාකරණය කිරීම
- ප්‍රමාණාත්මකතාව සහිතව තක්සේරුකිරීම
- නිවැරදිව වාර්තාකිරීම. (විගණන වාර්තා විකරණය කිරීම)

**(e) කොටස**

විගණන වාර්තාවක විගණකගේ මතය විකරණය කරනු ලබන අවස්ථා දෙක (2) ක් පැහැදිලි කිරීම මෙම කොටසින් අවශ්‍යකර තිබුණි. විගණකගේ මතය විකරණය කරනු ලබන අවස්ථා ස්වඅධ්‍යයන පාඨමාලා ග්‍රන්ථයේ පැහැදිලිව දක්වා තිබේ.

**සමස්ත කාර්යසාධනය සාමන්‍ය මට්ටමට වඩා පහළින් පැවතුණේය.**

\- - -

**විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.
- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.
- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දෑ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් විභාගවල ප්‍රශ්නවලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.
- ප්‍රශ්න පත්‍ර වල පරීක්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මගින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.
- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙල කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නගා ගැනීම සිදුකළ යුතුය.
- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.
- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.
- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.
- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට ඵලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.
- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.
- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍ය කරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

- * * * -